# විද්‍යාව - 10 ශ්‍රේණිය විෂයමාලාව - භෞතික විද්‍යාව

| නිපුණතා සහ නිපුණතා මට්ටම් | සන්ධාරය |
|---|---|
| 1. බලය සහ සරල රේඛීය චලිතයට අදාළ සම්බන්ධතා, ජීවිත අවශ්‍යතා සපුරා ගැනීමට යොදා ගනියි.<br>1.1 වස්තුවක් චලිත වූ අයුරු සන්නිවේදනය කිරීමට චලිතය පිළිබඳ ප්‍රස්තාර භාවිත කරයි. | • දුර (d) සහ විස්ථාපනය (s)<br>• වේගය සහ ප්‍රවේගය (v)<br>• දුර - කාල ප්‍රස්තාර (d-t)<br>• විස්ථාපන- කාල ප්‍රස්තාර (s-t)<br>• (d-t)සහ (s-t) ප්‍රස්තාරවලින් ලබා ගත හැකි තොරතුරු |
| 1.2 වේග-කාල සහ ප්‍රවේග - කාල ප්‍රස්තාර ඇසුරෙන් යම් වස්තුවක් චලිත වූ අයුරු විමසා බලයි. | • ත්වරණය සහ මන්දනය(a)<br>• වේග - කාල ප්‍රස්තාර(v-t)<br>• ප්‍රවේග- කාල ප්‍රස්තාර(v-t)<br>• (v-t) ප්‍රස්තාර ඇසුරෙන් ලබා ගත හැකි තොරතුරු |
| 1.3 සරල රේඛීය චලිතයේ යෙදෙන වස්තුවල ඉදිරි අවස්ථා පුරෝකථනය කරයි. | • චලිත සමීකරණ<br>  • $v = u + at$<br>  • $s = ut + \frac{1}{2}at^2$<br>  • $v^2 = u^2 + 2as$<br>  • $s = \left(\frac{v+u}{2}\right)t$<br>• ඉහත සමීකරණ භාවිතය |
| 1.4 එදිනෙදා ජීවිතයේ දී බලය යොදා ගන්නා ආකාර චලිතය පිළිබඳ නිව්ටන් නියම ඇසුරෙන් විමසා බලයි. | • චලිතය පිළිබඳ නිව්ටන් නියම<br>  • පළමුවැනි නියමය<br>  • බලය පිළිබඳ සංකල්පය |
| 1.5 බලයේ විශාලත්වය සෙවීමට පරීක්ෂණ මෙහෙයවයි. | • ගම්‍යතාව පිළිබඳ සංකල්පය<br>• චලිතය පිළිබඳ නිව්ටන් නියම<br>  • දෙවන නියමය<br>  • $F = ma$ සම්බන්ධය<br>  • බලයේ අන්තර් ජාතික ඒකකය (N)<br>  • බලයේ අගය |
| 1.6 වස්තු අතර අන්තර් ක්‍රියා ඇති විය හැකි විවිධ ක්‍රම ප්‍රයෝජනයට ගනියි. | • චලිතය පිළිබඳ නිව්ටන් නියම<br>  • තුන්වන නියමය<br>  • ක්‍රියාව<br>  • ප්‍රතික්‍රියාව |

| නිපුණතා සහ නිපුණතා මට්ටම් | සන්ධාරය |
|---|---|
| 1.7 ඝර්ෂණය අවශ්‍ය පරිදි යොදා ගනිමින් එදිනෙදා ජීවිත කටයුතු හසුරුවයි. | • ඝර්ෂණය<br>• ඝර්ෂණ බලය<br>• සීමාකාරී ඝර්ෂණ බලය |
| 1.8 ඒකතල බලවල ක්‍රියාකාරිත්වය යටතේ විවිධ වස්තු සමතුලිතව පවතින ආකාර විමසා බලයි. | • ඒකතල බලවල සමතුලිතතාව<br>  • බල දෙකක සමතුලිතතාව<br>  • බල තුනක සමතුලිතතාව<br>    • ඒක ලක්ෂ්‍ය බල<br>    • සමාන්තර බල |
| 1.9 බලයක භ්‍රමණ ආචරණය වෙනස් කිරීමට පරීක්ෂණ<br>මෙහෙයවයි. | • බලයක ඝූර්ණය<br>  • බලයක ඝූර්ණය කෙරෙහි බලපාන සාධක<br>  • බල ඝූර්ණයේ ඒකක - ( N m )<br>• බල යුග්මය |
| 2. තරල මගින් වස්තු මත ඇති කරන තෙරපුම පිළිබඳ ව සොයා බලයි.<br>2.1 ඝන, ද්‍රව සහ වායු මගින් ඇති කරන පීඩනය දෛනික කටයුතු සඳහා භාවිතයට ගනියි. | • පීඩනය පිළිබඳ සංකල්පය<br>  • පීඩනය මැනීම සඳහා භාවිත කළ හැකි ඒකක<br>• ඝන වස්තු සහ ද්‍රව මගින් ඇති කරන පීඩනය<br>• වායුගෝලීය පීඩනය<br>• එදිනෙදා කටයුතු සඳහා පීඩනය භාවිතයට ගැනීම |
| 2.2 ද්‍රව තුළ ඇති වස්තු මත ක්‍රියා කරන බල විමසා බලයි. | • ආකිමිඩීස් මූලධර්මය<br>• ඉපිලීම<br>  • ද්‍රව මානය |
| 3. යාන්ත්‍රික ශක්තිය එදිනෙදා ජීවිත කටයුතු සඳහා යොදා ගනියි.<br>3.1 යාන්ත්‍රික ශක්තිය කාර්ය කිරීමට දායක වන ආකාර සොයා බලයි. | • කාර්යය<br>  • කාර්ය මැනීමේ අන්තර්ජාතික ඒකකය (J)<br>• යාන්ත්‍රික ශක්තිය<br>  • විභව ශක්තිය<br>  • චාලක ශක්තිය<br>• ශක්ති සංස්ථිති නියමය<br>• ක්ෂමතාව<br>• ක්ෂමතාවයේ අන්තර්ජාතික ඒකකය (W )<br>• ශක්තිය හා ක්ෂමතාව අතර සම්බන්ධය<br>• kWh ශක්තියේ ඒකකයක් ලෙස |
| 3.2 යාන්ත්‍රික ශක්තියේ අගය නිමානය කරයි. | • විභව ශක්තිය - $E_p = mgh$<br>• චාලක ශක්තිය - $E_k = \frac{1}{2}mv^2$<br>• ශක්තිය ගණනය කිරීම<br>• ශක්තියේ සංස්ථිතික ස්වභාවය |

| නිපුණතා සහ නිපුණතා මට්ටම් | සන්ධාරය |
|---|---|
| 3.3 කාර්ය පහසු කර ගැනීමේ විවිධ ක්‍රම සොයා බලයි. | • සරල යන්ත්‍ර සහ එන්ජින්<br>  • යාන්ත්‍ර වාසිය<br>  • ප්‍රවේග අනුපාතය<br>  • කාර්යක්ෂමතාව |
| 4. තාපජ ශක්තිය මැනීමේ හා සංක්‍රාමණය කිරීමේ ක්‍රම භාවිතයට ගනියි.<br>4.1 තාප හුවමාරුව නිසා සිදු වන උෂ්ණත්ව වෙනස්වීම් මනියි. | • උෂ්ණත්ව සංකල්පය<br>  • උෂ්ණත්ව පරිමාණ<br>    • සෙල්සියස් පරිමාණය - ($^0$C)<br>    • ෆැරන්හයිට් පරිමාණය - ($^0$F)<br>• උෂ්ණත්වය මැනීමේ අන්තර්ජාතික ඒකකය (K) |
| 4.2 වස්තුවක් ලබා ගන්නා තාප ප්‍රමාණය ගණනය කරයි. | • තාප ප්‍රමාණය<br>  • තාප ධාරිතාව<br>  • විශිෂ්ට තාප ධාරිතාව c<br>  • තාප ප්‍රමාණය ( $Q = mc\theta$ ) J |
| 4.3 තාපජ ශක්තිය කාර්යක්ෂම ව යොදා ගනියි. | • තාපය සංක්‍රාමණය වන ක්‍රම<br>  • සන්නයනය<br>  • සංවහනය<br>  • විකිරණය<br>• තාපය සංක්‍රාමණය වන ක්‍රම භාවිතයට ගන්නා අවස්ථා |
| 5. විද්‍යුතය සම්බන්ධ සංසිද්ධි හා මූලධර්ම එදිනෙදා ජීවිතයේ දී යොදා ගනියි.<br>5.1 විද්‍යුත් ආරෝපණ ජනනය කර ගබඩා කරයි. | • ස්ථිති විද්‍යුතය<br>  • ඝර්ෂණයෙන් වස්තූන් ආරෝපණය කිරීම<br>  • ධන ආරෝපණ<br>  • සෘණ ආරෝපණ<br>  • ආරෝපණ අනාවරණය කිරීම<br>    • ස්වර්ණ පත්‍ර විද්‍යුත් දර්ශකය<br>  • ධාරිත්‍රක (ආරෝපණ ගබඩා කිරීමේ උපකරණයක් ලෙස) |
| 5.2 විභව අන්තරය හා ධාරාව අතර සම්බන්ධතාව දෛනික කටයුතු සඳහා භාවිත කරයි. | • විද්‍යුත් ධාරාව (I )<br>  • ඒකකය- (ඇම්පියරය - A)<br>  • ඇමීටර භාවිතය<br>• විභව අන්තරය (V)<br>  • ඒකකය (වෝල්ටය - V)<br>  • වෝල්ට්මීටර භාවිතය<br>• ඕම්ගේ නියමය ($V=IR$)<br>  • ප්‍රතිරෝධය<br>  • ඒකකය (ඕමය - $\Omega$ ) |

| නිපුණතා සහ නිපුණතා මට්ටම් | සන්ධාරය |
|---|---|
| 5.3 ප්‍රතිරෝධය ධාරාව කෙරෙහි බලපාන ආකාරය විමර්ශනය කරයි. | • ප්‍රතිරෝධයක අගය<br>    • වර්ණ කේත ක්‍රමය<br>• ශ්‍රේණිගත ප්‍රතිරෝධවල සමක ප්‍රතිරෝධය<br>    • $R = R_1 + R_2$<br>• සමාන්තරගත ප්‍රතිරෝධවල සමක ප්‍රතිරෝධය<br>    • $\frac{1}{R} = \frac{1}{R_1} + \frac{1}{R_2}$ |
| 5.4 අවස්ථාවට උචිත පරිදි සරල විද්‍යුත් පරිපථ නිර්මාණය කරයි. | • පරිපථ උපාංග<br>    • විදුලි කෝෂ<br>    • ස්විච්චි<br>    • ප්‍රතිරෝධ<br>    • විදුලි පන්දම් බල්බ |